**කොවිඩ් 19 - සති පාසල**

**2021 - දෙවන වාරය - හත්වන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

## 4 - ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය

**ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය ආශ්‍රිත ගැටළු, ප්‍රවණතා හා ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කෘෂිකර්මයේ ඇති වැදගත්කම**
(පෙළපොත පිටු අංක 77-84)

- ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළු භූමි පරිභෝගය ආශ්‍රිත, නිෂ්පාදනය ආශ්‍රිත, වෙළඳාම සම්බන්ධ හා පාරිසරික ගැටළු ලෙස ක්ෂේත්‍ර හතරක් ඔස්සේ හඳුනාගත හැකිය.
- වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයෙහි ප්‍රවණතාවන්ද නිෂ්පාදන ආශ්‍රිත, තාක්ෂණය අශ්‍රිත, වෙළඳාම ආශ්‍රිත හා රාජ්‍ය අනුග්‍රහය ලෙස අංශ හතරක් ඔස්සේ සාකච්ඡා කළ හැකි වේ.
- අතීතයේ සිටම ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කෘෂිකර්මාන්තයට ඉතා වැදගත් තැනක් හිමි වීමට හේතු කිහිපයකි.

    මෙරට දළ දේශීය නිෂ්පාදනයෙන් 11.1% ක දායකත්වයක් කෘෂිකර්මාන්තය විසින් දැරීම.
    ආහාර නිෂ්පාදනයට හා කර්මාන්ත රැසකට අමුද්‍රව්‍ය සැපයීම.
    මෙරට මුළු ශ්‍රම බලකායෙන් 31% ක් කෘෂිකාර්මික අංශයෙහි සේවා නියුක්තිකයන් වීම.
    ශ්‍රී ලංකාවේ අපනයන ආදායමෙන් 24 %ක් කෘෂි අංශය මගින් ඉපයේ.

**ක්‍රියාකාරකම**

01. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව බලපා ඇති ගැටළු බෙදා දැක්විය හැකි ක්ෂේත්‍ර හතර දක්වා ඒවාට උදාහරණ දෙක බැගින් ලියන්න.

02. මෙරට කෘෂිකර්මාන්තයේ මෑත කාලීනව දක්නට ඇති නිෂ්පාදනය ආශ්‍රිත ප්‍රවණතා දෙකක් හා රාජ්‍ය අනුග්‍රහය සම්බන්ධ ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න.

03. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කෘෂිකර්මාන්තයට ඉතා වැදගත් තැනක් හිමි වේ. මෙය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.